රත්නසිරි, ඒ. ඩී. රවීන්ද්‍ර

*Paper: Diversity*

# පොළොන්නරුවේ තිවංක පිළිමගෙයි සිතුවම් හි ශෛලිය පිලිබඳ අධ්‍යයනයක්

තිවංක පිළිමගෙය පොළොන්නරුව අවධියට අයත් චිත්‍ර දැකගත හැකි ප්‍රධානතම ස්ථානය යි. මෙය 12 වන සියවසේ දී පළමුවන පරාක්‍රමබාහු රජු විසින් ඉදිකර එහි මල්කම්, ලතාකම් ආදී සිතුවම් ඇඳි බව *චූලවංශයේ* සඳහන් වෙයි. එමෙන්ම දඹදෙණිය අවධියේ දී දෙවන පරාක්‍රමබාහු රජු ආගමික ගොඩනැගිලි ප්‍රතිසංස්කරණයේදී තිවංක පිළිමගෙය පිළිසකර කර ඇත.

දැනට තිවංක පිළිමගෙයි අන්තරාලය හා ගර්භගෘහය යන කොටස් දෙකෙහි චිත්‍ර ඉතිරිව පවතී. ඒ, අන්තරාලයේ මුල් භාගයේ ජාතක කථා ඇතුළත් සිතුවම් ද එහි දෙවන භාගයේ දේවාරාධනය ඇතුළත් සිතුවම ද ගර්භගෘහයේ බුද්ධ චරිතයේ සිදුවීම් ඇතුළත් සිතුවම් ද ආදී වශයෙනි. මෙම සිතුවම් පිළිබද බොහෝ විචාරකයින්ගේ මතය වන්නේ මේවා කාල සීමාවන් දෙකක දී සම්ප්‍රදායන් දෙකක් අනුව නිර්මාණය වූ ඒවා බවයි. විශේෂයෙන් ම ජාතක කථා සිතුවම් හා බුද්ධ චරිතයේ සිදුවීම් ඇතුළත් සිතුවම් අතර වෙනස මෙහිදී ප්‍රධාන වශයෙන් සාකච්ඡාවට ලක් වෙයි. පිළිමගෙය හා එහි සිතුවම් දඹදෙණි යුගයේදී ප්‍රතිසංස්කරණයන්ට භාජනය වීමත්, පුරාවිද්‍යාත්මක නිරීක්ෂණ මගින් මෙහි සිතුවම් ස්ථර දෙකක් අනාවරණය කරගෙන තිබීමත්, රූප රාමු සංවිධානයේ ඇති වෙනසත් ආදිය පදනම් කරගෙන උක්ත නිගමනයන්ට එළඹ ඇත.

මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් බලාපොරොත්තු වන්නේ තිවංක පිළිමගෙයි බිතු සිතුවම් සම්ප්‍රදායයන් දෙකක් නොව එකම සම්ප්‍රදායක එකම ශෛලියකට අයත් සිතුවම් බව අනාවරණය කිරීමයි. මේ සඳහා ගර්භගෘහයේ හා අන්තරාලයේ සිතුවම් හි රූප සංවිධානය, රේඛා භාවිතය, වර්ණකිරීම, පර්යාවලෝකනය, ත්‍රිමාණ ලක්ෂණ, අලංකරණාංග දැක්වීම, ස්වභාවිකත්ව නිරූපණය ආදී චිත්‍ර කලා ලක්ෂණ සැසඳීමෙන් ලත් නිගමන පදනම් කරගෙන ඇත. එමෙන්ම මේ පිළිබඳව නන්ද අග්‍රාවාල් සිදුකළ විද්‍යාත්මක කාලනිර්ණ පරීක්ෂාවන්ගේ තොරතුරු ද මීට දායක කරගෙන ඇත.

තිවංක පිළිමගෙයි සිතුවම් පිළිබඳ දිය හැකි නිගමනය වන්නේ මේ වූකලී 12 වන සියවසේ, පළමු පරාක්‍රමබාහු රජුගේ කාල සීමාවට අයත් එකම සම්ප්‍රදායකට අයත් සිතුවම් ශෛලියක් බවයි.